# A MORPHOLOGICAL ANALYSIS OF *PŪRWA KRIYĀ* IN THE SIGIRIYA GRAFFITI

I Munaweera[1] and V Weerawardhana[2]

**Abstract**

The Sigiriya poems represent a highly valuable component of Sinhala literature. Composed by various visitors to Sigiriya during the 8th to 10th centuries AD, these poems preserve linguistic features characteristic of the medieval period of the Sinhala language. This research aims to examine the structure of Sinhala *pūrwa kriyā* that occur under infinitive verbs in the Sigiriya poems. The research problem is to analyse the form and structure of these past participles as found in the poems dated to the 8th, 9th, and 10th centuries AD. Employing a qualitative research methodology, this study uses Sigiri Graffiti by Senarath Paranavithana as a secondary source to collect data. Additionally, reference materials on the Sinhala language, grammar, and linguistics were consulted as tertiary sources. The data were analysed using the theoretical frameworks of morphological analysis. Significantly, the study provides authentic insights into the use and structure of Sinhala past participles in the Sigiriya poems. The findings reveal that the past tense verb structures from this period exhibit several distinctive features, contributing to a deeper understanding of the historical development of Sinhala grammar.

***Keywords***: Infinitive Verbs, Linguistics, Past Participle, Sinhala Grammar, Sigiri Graffiti

[1]Department of Linguistics, University of Kelaniya, Sri Lanka.

Email: indikamunaweera13@gmail.com https://orcid.org/0009-0007-9427-7279

[2]Department of Linguistics, University of Kelaniya, Sri Lanka.

Email: vindhya@kln.ac.lk https://orcid.org/0009-0000-3093-2288

Proceeding of the 3rd Desk Research Conference – DRC 2025 © 2025 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 30.05.2025 Accepted date: 01.10.2025
Print Publishing Date: 31.10.2025 Web Publishing Date: 31.10.2025

## සීගිරි පද්‍යවල සඳහන් පූර්ව ක්‍රියාව පිළිබඳ පදිමවිචාරාත්මක විමසුමක්

**අයි. මුණවීර සහ වී. වීරවර්ධන**

**සාරසංක්ෂේපය**

ක්‍රි.ව. 8, 9, 10 යනාදි සියවස්වල සීගිරිය නැරඹීමට නන්දෙසින් පැමිණි විවිධ පිරිස් මේ පද්‍ය රචනා කොට ඇත. එනම්, සිංහල භාෂාවේ මධ්‍යතන යුගයට අයත් භාෂා ලක්ෂණ මෙහි ශේෂ වී පවතී. මෙම පර්යේෂණයෙහි අරමුණ වනුයේ සීගිරි පද්‍යවල සඳහන් අසමාපක ක්‍රියා යටතට ගැනෙන පූර්ව ක්‍රියාවේ සංස්ථිතිය පිළිබඳ විමර්ශනයක යෙදීමයි. ක්‍රි.ව. 8, 9, 10 යනාදි සියවස්වල රචිත සීගිරි ගීවල ඇති පූර්ව ක්‍රියාවේ සංස්ථිතියෙහි ස්වරූපය කෙබඳු ද යන්න අධ්‍යයන කිරීම මෙම පර්යේෂණයෙහි ගැටලුවයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගනිමින් සිදු කෙරෙන මෙම අධ්‍යයනයේ දත්ත සම්පාදනය කිරීම සඳහා සෙනරත් පරණවිතාන විසින් රචිත සීගිරි ග්‍රැෆිටි කෘතිය ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාවිත කරන ලදි. ඒ ආශ්‍රයෙන් මීට අමතරව තෘතීයික මූලාශ්‍රය වශයෙන් සිංහල භාෂාව, සිංහල ව්‍යාකරණය, වාග්විද්‍යාත්මක ග්‍රන්ථ මූලාශ්‍රය වශයෙන් භාවිත කෙරිණි. පදිම විචාරයේ එන සෛද්ධාන්තික කරුණු ආශ්‍රයෙන් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි. මෙම අධ්‍යයනය මඟින් සීගිරි පද්‍යවල සඳහන් පූර්ව ක්‍රියාපද හා ඒවායෙහි සංස්ථිතිය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ලබා ගැනීමට හැකිවීම විශේෂත්වයකි. මේ අනුව මෙම අධ්‍යයනයෙහි නිගමනය වශයෙන් මෙම යුගවලට අයත් පූර්ව ක්‍රියාපදවල සංස්ථිතියෙහි ඊටම ආවේණික ලක්ෂණ රැසකින් යුක්ත වන බව හඳුනාගත හැකිය.

***ප්‍රමුඛ පද:*** අසමාපක ක්‍රියාපද, පූර්ව ක්‍රියාව, වාග්විද්‍යාව, සිංහල ව්‍යාකරණය, සීගිරි පද්‍ය

### හැඳින්වීම

ක්‍රි.ව. 7, 8 සියවස් කාලය තුළ ආරම්භ වී ක්‍රි.ව. 13 වන සියවසෙහි මැද භාගය දක්වා වූ කාලය සිංහලයේ මධ්‍යතන යුගය වශයෙන් සැලකෙයි. සිංහල භාෂාවේ පරිණාමය සම්බන්ධයෙන් පරිණාමීය ලක්ෂණ රැසක් ප්‍රකට කරන කාල වකවානුවක් ලෙස මෙම අවධිය හැඳින්විය හැකිය. මෙම අවධිය සිංහල භාෂා විෂයෙහි වැදගත් වනුයේ ප්‍රාකෘත භාෂා ලක්ෂණවලින් ඉවත් වෙමින් සිංහල භාෂාවට විශේෂ ලක්ෂණ රැසක් එකතු වූ සංක්‍රමණික අවස්ථාවක් ලෙසය (ජේමානන්ද, 2004). මෙම අවධියෙහි භාෂා ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ඉතා වැදගත් මූලාශ්‍රයක් ලෙස සීගිරි පද්‍ය දැක්විය හැකිය. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වනුයේ සීගිරි පද්‍යවල සඳහන් පූර්ව ක්‍රියා පද පිළිබඳ වාග්විද්‍යාත්මක විශ්ලේෂණයක නිරත වීමයි.

ශ්‍රී ලංකාවේ ක්‍රි.ව. 8, 9, 10 යන ශතවර්ෂවලට අයත් සිංහල භාෂාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී සීගිරි කැටපත් පවුරේ ලියා ඇති සීගිරි පද්‍ය ඉතා වැදගත් තැනක් ගනී. එනම් මෙම යුගවලදී සිහගිරි පර්වතයට නැගුණු ඇතැම් රසඥයෝ එහි බිත්තියෙහි සිත්තම් කොට තිබූ කතුන් හා අවට පරිසරය බලා තම මනෝභාවයෙහි පහළ වූ අදහස් පද්‍යයට නගමින් එහි ලියූහ. මෙසේ සිංහල බසින් රචිත පද්‍ය 685ක් පමණ ඇති බව හඳුනාගෙන තිබේ (මුදියන්සේ, 2004). මෙම පද්‍ය දෙස අවධානය යොමු කිරීමේදී ඒවායෙහි භාෂා ශෛලිය, වාක්කෝෂය හා ව්‍යාකරණ ලක්ෂණ අතින් ඉතා වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කොටගෙන තිබේ. විශේෂයෙන් මෙම සීගිරි පද්‍ය එම යුගවලදී ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සිට එය නැරඹීම සඳහා පැමිණි පුද්ගලයන් විසින් රචනා කොට තිබීමත්, එම යුගවලදී විවිධ ප්‍රදේශවල භාවිත වූ ව්‍යවහාරික සිංහල භාෂාවේ ස්වරූපය මැනවින් ප්‍රකට වීමත්, වර්තමානය වන විට එම භාෂා ලක්ෂණ එලෙසින්ම සීගිරි පද්‍ය තුළ ශේෂව පැවතීමත් නිසා මෙම සාහිත්‍ය අංගය ඉතා වැදගත් වේ. සමකාලීන සාහිත්‍ය දෙස අවධානය යොමු කිරීමේ දී ආගමික සාහිත්‍ය පදනම් කොටගෙන පොතපත රචනා වී ඇති අතර සීගිරි කුරුටු ගී සාහිත්‍ය අංගයක් වශයෙන් ඉතා වැදගත් වේ. මෙම සීගිරි පද්‍යවල භාෂාව මඟින් එවකට පැවති ජන සාහිත්‍ය, ජන විඥානය හා ජන සමාජය අධ්‍යයනය කිරීමෙහිලා ද අතිශයින් වැදගත් ලේඛන වාර්තාවත් ලෙස පෙන්වාදිය හැකිය. එකල සිංහල භාෂාවේ ව්‍යවහාර වූ නාමපද, ක්‍රියාපද, නිපාත පද, යනාදි භාෂාත්මක ලක්ෂණ මෙම පද්‍ය තුළ ගැබ්ව පැවතීමත්, වාග්විද්‍යාත්මක විමර්ශනයක් සඳහා අවැසි තොරතුරු අන්තර්ගත වීමත් මෙහිලා ඇති විශේෂත්වයක් ලෙස දැකිවිය හැකිය. ඒ අතර පූර්වෝක්ත යුගවලදී සිංහල භාෂාවේ ක්‍රියාපදයේ සංස්ථිතිය පිළිබඳ බොහෝ තොරතුරු විමර්ශනය කරගත හැකිය. ඒ අනුව මෙම පර්යේෂණයේ දී සීගිරි ගීවල සඳහන් පූර්ව ක්‍රියාව පිළිබඳ අධ්‍යයනයක් සිදු කරනු ලැබේ.

සිදත් සඟරා කතුවරයා ක්‍රියාව යන්න දක්වා ඇත්තේ "නොදැව් නුගුණ දැව් නිසා සකරුණෙන් දා මුව මැ සිදු කිරිය නම්" යන්නයි. මෙම නිර්වචනයට අනුව ක්‍රියාපද පිළිබඳ ලක්ෂණ පහක් හඳුනාගත හැකි බව ජේ.බී දිසානායක (2001) දක්වා ඇත. එනම්,

> ක්‍රියාව යනු ද්‍රව්‍යයක් නොවේ. (නොදැව්)
> ක්‍රියාව යනු ගුණයක් නොවේ. (නුගුණ)
> ක්‍රියාව ද්‍රව්‍ය නිසා සිදු වේ. (දැව් නිසා)
> ක්‍රියාව කාරක හයක් හා සම්බන්ධ වේ. (සකරුණෙන්)
> ක්‍රියාව ධාතු පාදක කොට සිදු වේ. (දාමුව වැ) (දිසානායක, 2001)

මේ ලක්ෂණවලින් ක්‍රියාපදයක් යනු කුමක්ද යන්න මනාව හඳුනාගත හැකිය.

ඩබ්.එස්. කරුණාතිලක (2014) ක්‍රියාපද යන්න සරලව දක්වා ඇත්තෙ වාක්‍යයක ආඛ්‍යාත ස්ථානයෙහි යෙදෙන, ධාතු මූලික වූ කේන්ද්‍රීය පදය ක්‍රියාපද වන බවයි. ලිඛිත සිංහලයෙහි ක්‍රියා ධාතු පුරුෂ, වචන හා කාල යන ව්‍යාකරණ ලක්ෂණ සඳහා වරනැගෙන බව දක්වා ඇත. ක්‍රියාපද වරනැගීම සම්බන්ධයෙන් තොරතුරු දක්වන එතුමා සමාපක ක්‍රියා හා අසමාපක

ක්‍රියා යනුවෙන් ප්‍රධාන වර්ග කිරීමක් දක්වා ඇත. එනම් වාක්‍යාර්ථය සමාප්ත වන ක්‍රියාපද සමාපක ක්‍රියාපද ලෙසත්, වාක්‍යාර්ථය සමාප්තියට පත් නොවන ක්‍රියා අසමාපක ක්‍රියා වන බව සඳහන් කොට ඇත (කරුණාතිලක, 2014). එහිදී අසමාපක ක්‍රියා යටතේ පූර්ව ක්‍රියා දක්වා ඇත.

තවද මෙම ව්‍යාකරණ ග්‍රන්ථයෙහි පූර්ව ක්‍රියාවක් සකස් කර ගන්නා ආකාරය පිළිබඳව දක්වා තිබේ. එනම්, පූර්ව ක්‍රියා රූප සාධනයේ දී පොදුවේ යෙදෙන ප්‍රත්‍යය ලෙස -ආ, -ඇ, -ඊ යනුවෙන් ප්‍රත්‍යය කිහිපයක් සඳහන් කර ඇත. මෙහි දී ආකාරාන්ත ධාතු සමඟ -ආ ප්‍රත්‍යත්, ඉකාරාන්ත ධාතු සමඟ -ඇ ප්‍රත්‍යයත්, එකාරාන්ත ධාතු සමඟ -ඊ ප්‍රත්‍යයත් යෙදෙන බව දක්වා තිබේ. ඇතැම් ධාතු සමඟ -ආ ප්‍රත්‍යය මෙන්ම -ඇ ප්‍රත්‍යයත්, ඇතැම් ධාතු සමඟ -ඊ ප්‍රත්‍යය මෙන්ම -ඇ ප්‍රත්‍යයත් යෙදෙන බවත් සඳහන් කොට ඇත. සිංහල භාෂාවේ ඇතැම් ර-කාරාන්ත ධාතුවලට ට-කාරාන්ත විශේෂ රූප යෙදෙන බව සඳහන් කොට ඇත. ප්‍රයෝජ්‍ය ක්‍රියා ශබ්දවල පූර්ව ක්‍රියා සාධනය අකාරාන්ත ධාතුවල පූර්ව ක්‍රියා සාධනයට සමාන බවත්, පූර්ව ක්‍රියා පදයෙන් පරව ල- ධාතුවෙහි පූර්ව ක්‍රියා රූපය වන "ලා" යන්න ද පූර්ව ක්‍රියා අර්ථයෙහිම යෙදෙන බවත් සඳහන් කොට ඇත (කරුණාතිලක, 2014).

සිදත් සඟරා කතුවරයා පූර්ව ක්‍රියා යන්න දක්වා ඇත්තේ වාක්‍යයක ක්‍රියා දෙකක් හෝ කිහිපයක් ඒක කර්තෘක නම් එකක් අපර ක්‍රියා වන බවයි. අන්‍ය එකක් හෝ බොහෝමයක් හෝ පූර්ව ක්‍රියා වන බව දක්වා ඇත. පෙර කතු කිරියෙන් පෙර කිරියට ඇ ආ ඊ මේ අනුව සිදත් සඟරාවේ -ඇ, -ආ, -ඊ, -ඉන්, -ඇලා, -ආලා, -ඊලා, -ඉන්ලා, යනුවෙන් පූර්ව ක්‍රියා සාධනය හා සම්බන්ධ ප්‍රත්‍ය දක්වා තිබේ. නමුත් මෙහිලා පූර්ව ක්‍රියා ප්‍රත්‍ය වශයෙන් දැක්විය හැක්කේ මුලින් දැක් වූ ප්‍රත්‍යය සතර පමණි. පසුව සඳහන් ප්‍රත්‍යය සතරේ එන -ලා යන්න ල- ධාතුවෙන් නිපන් පූර්ව ක්‍රියාවකි. ක්‍රියාර්ථය ව්‍යක්ත කරනු පිණිස සිංහලයේ වෙනත් ධාතුවකින් සැදුණු පදයක් එකතු කරනු ලැබේ. මෙහි -ලා යන්න එසේ එක් වූ පූර්ව ක්‍රියා පදයකි (සෝමාලෝකතිස්ස හිමි, 2014).

කුමාරතුංග මුනිදාසගේ ක්‍රියා විවරණයෙහි (2022) පූර්ව ක්‍රියා යන්න නිපාත ක්‍රියා යටතේ දක්වා තිබේ. එහි නිපාත ක්‍රියා යන්න දක්වනුයේ ක්‍රියාර්ථයකින් යුක්ත වූයේ නිපාත ක්‍රියා නම් යන්නයි. එනම් එක් ක්‍රියාවකට විශේෂණ ව සිටින අප්‍රධාන ක්‍රියාපද නිපාත ක්‍රියා නම් වන බව දක්වා ඇත. කෘදන්ත නිපාත යන්න ද මීටම නමකි. මෙහි දී අතීත නිපාත ක්‍රියා සාධනයෙහි -ආ, -ඇ, -ඊ යනුවෙන් ප්‍රත්‍ය තුනක් දක්වා තිබේ. පරස්මෛපදයෙහි √බල, √බම, √බණ, √පිහිට, √රක්, √බස් යන ධාතු ගණ සමඟ -ආ සහ -ඇ ප්‍රත්‍ය යෙදෙන බවත් ආත්මනේපදයෙහි √පිහිට, √රක්, √බස් යන ධාතු ගණ සමඟ -ඊ සහ -ඇ ප්‍රත්‍ය යෙදෙන බව සඳහන් කරයි. තවද, -ඊ ප්‍රත්‍ය කර්ම කාරකයෙහි සියලු ධාතු සමඟ යෙදෙන බව සඳහන් වේ. √බල ආදි ධාතු ගණ සමඟ ආත්මනේපද ධාතු නොමැති බවත් √බම සහ √බණ ආදි ධාතුවකින් නිපන් ආත්මනේපද අතීත නිපාත ක්‍රියාවක් නොලැබෙන බව සඳහන් කර ඇත (මුනිදාස, 2022).

කුමාරතුංග මුනිදාස තම ක්‍රියා විවරණයෙහි අතීත නිපාත ක්‍රියා හෙවත් පූර්ව ක්‍රියා පද සාධන සිදු වන ආකාර කිහිපයක් ඉදිරිපත් කරයි.

1. "එ" අන්ත හෝ "ඔ" අන්ත ධාතුවකින් පරව කවර පදයක වුවද යෙදෙනුයේ -ඊ ප්‍රත්‍යයයි.
   දෙ + ඊ = දී / පො + ඊ = බී / සෙ + ඊ = සී
2. ඇතැම් ධාතු නිසා අසාධ්‍ය වූ නිපාත ක්‍රියා ඇති වේ.
   කර = කොට-කොටැ/ ය = ගොස්/ එ = අවුදු-අවුත්-ඇවිත්/ වපුර = වපුට-වපුටැ
3. මෙබඳු ඇතැම් රූප "ඉනි" ප්‍රත්‍යයයද ගනී.
   කොටැ + ඉනි = කොටිනි/ ගොස් + ඉනි = ගොසිනි
4. "ලා" යන්න ප්‍රත්‍යයක් නොව අන්‍ය වූ අතීත නිපාත ක්‍රියාවකි.
   පලා මල්ලෙහි ලා ගෙනෙව
5. "ගන්", "පිය" යනාදිය ද "ලා" යන්න මෙන් අන්‍ය අතීත නිපාත ක්‍රියාවකි.
   බුදුන් වැදැ - ගෙනැ/ බුදුන් වැදැ - පියා (මුනිදාස, 2022).

ක්‍රියා විවරණය කෘතියෙහි අතීත නිපාත හෙවත් පූර්ව ක්‍රියා අර්ථ හයක් පහත් පරිදි දක්වා තිබේ.

1. අතීතාර්ථය = දරුවා බත් කා නිඳයි
2. වර්තමානාර්ථය = පියා පුතු සොයා යෙයි.
3. අනාගතාර්ථය = හේ වන සතුන් වළකා වැට බඳී.
4. ආවස්ථිකාර්ථය = දරුවා මව දැකැ ද හඬයි. (ආවස්ථික නිපාත ක්‍රියා)
5. හේත්වර්ථය = වැසි වැසැ ගඟ පිරෙයි.
6. ප්‍රකාරාර්ථය = ගුරුන් සිත් ගෙනැ උගනී.

මෙහි දක්වනුයේ අතීත නිපාත ක්‍රියාව හා සම්බන්ධ වන්නා වූ අන්‍ය ක්‍රියාව ද සාමාන්‍ය වශයෙන් එකම කර්තෘට අයත් වන බවයි (මුනිදාස, 2022).

තිඹිරිවැව සුමනසාර හිමියන්ගේ සිංහල භාෂා ව්‍යාකරණය කෘතියෙහි පෙර කිරිය හෙවත් පූර්ව ක්‍රියාව යන්න දක්වා ඇත්තේ කර්තෘගේ අවසාන ක්‍රියාවට පෙර සිදු කරනු ලබන ක්‍රියාව පූර්ව ක්‍රියාව නම් වන බවයි. මෙම කෘතියේ ද සිදත් සඟරාවේ මතු සඳහන් ප්‍රත්‍යම දක්වා ඇති අතර ඉන් පළමු ප්‍රත්‍ය සතර පූර්ව ක්‍රියා ප්‍රත්‍ය ලෙස දක්වා තිබේ. එසේ ම ලා යන්න

ප්‍රත්‍යයක් නොව පූර්ව ක්‍රියාවක් ලෙස සැලකීම නිවැරදි බවද සඳහන් කොට තිබේ. මෙහි දී ඇතැම් ව්‍යාකරණඥයෝ ඉන් යන ප්‍රත්‍ය පූර්ව ක්‍රියා ප්‍රත්‍යයක් ලෙස නොසලකන බවත් පරණවිතාන මතයට අනුව ගන්ත්වාන, ලද්ධාන වැනි මධ්‍ය ඉන්දියානු පූර්ව ක්‍රියා රූපයන්ගෙන් එය බිඳී එන්නට ඇති බව දක්වා තිබේ (මුනිදාස, 2022).

සෙනරත් පරණවිතානගේ අදහසට අනුව සිංහලයේ ආකාරාන්ත, ඇකාරාන්ත හා ඊකාරාන්ත වශයෙන් පූර්ව ක්‍රියා ප්‍රත්‍ය කොටස් තුනකට බෙදා දක්වා ඇත. ඒ අනුව -අ, -ආ, -ඇ, -ඈ, -ඊ, -ඉන් යනුවෙන් පූර්ව ක්‍රියා ප්‍රත්‍ය හයක් දක්නට ලැබෙන බව දක්වා තිබේ. ලා පූර්ව ක්‍රියාව මෙම ප්‍රත්‍ය සමඟ සංයෝග වී ඇති බව ද ඉදිරිපත් වේ. -අ, -ආ, -ඇ අන්ත පූර්ව ක්‍රියා රූප ආත්මනේ පද අර්ථය ගන්නා විට -ඊ අන්ත වන බව දක්වා ඇත. උක්ත කෘතියෙහි ඉහත ප්‍රත්‍යය යෙදී සැකසෙන පූර්ව ක්‍රියාවලට අමතරව වෙනත් කොටස් දෙකක් පිළිබඳව ද තොරතුරු දක්වා තිබේ. එනම්, ප්‍රත්‍ය වෙන් කොට දැක්විය නොහැකි පූර්ව ක්‍රියා පදයි. මේවා මධ්‍ය ඉන්දියානු පූර්ව ක්‍රියාවන්ගෙන් බිඳී ආ බව දක්වා ඇත. (ආගන්තිවා = අවුත්/ කත්වා = කොට/ ගන්ත්වා = ගොස්) වශයෙනි. දෙවැනි ආකාරය නම් උපකාරක පූර්ව ක්‍රියාවක් සහිතව යෙදෙන පූර්ව ක්‍රියා පදයි. ගෙනැ, දමා, පියා, ලා වැනි ඒවාය (මුනිදාස, 2022).

විල්හෙල්ම් ගයිගර් සිංහල භාෂා ව්‍යාකරණය නම් කෘතියෙහි පූර්ව ක්‍රියාව ආකාර තුනක් යටතේ දක්වා ඇත.

ආ - අන්ත
ඇ - අන්ත
ඉ - අන්ත වශයෙනි.

මෙහිදී ප්‍රාකෘත සිංහලයෙහි -අය යන්නෙන් අන්ත වන පද හමුවන බව දක්වා තිබේ. කඩය, කරවය, කනවය යන්න නිදසුන් වේ. -අය යන්න -ආය යන්නට පත් වූ බවත් ආදාය, උට්ඨාය වැනි පාලි පද සිංහල පූර්ව ක්‍රියාවේ ප්‍රාග් අවස්ථාව බවත් දක්වයි. සිංහලයෙහි මධ්‍ය අවධියෙහි -ආය යන්න -අය් බවට පත් වී ඇති බව එතුමා සිය කෘතියෙහි සඳහන් කරයි. කරය්, නිමවය් යනාදිය උදාහරණ වේ. පසුය අ-ය් වෙනුවට -ආ යන්න ද -ආ යන්නට -අය් යන්න ද යෙදුනු බව සඳහන් කරයි. 12 වන සියවසින් පසු -ආ යන්න සිංහලයෙහි නියම පූර්ව ක්‍රියා ප්‍රත්‍ය බවට පත් වූ බව දක්වනු ලැබේ. දෙවැනි වරනැඟීම් අවස්ථාව ලෙස අ - අන්ත පූර්ව ක්‍රියා පැහැදිලි කිරීම දුෂ්කර බවත් ඊට හේතුව නම් සිංහල මධ්‍ය අවධියෙහි මුල් කාලයේ දී -ඇ අන්ත පුරාණ රූපයක් හමු වන බව දක්වයි. පසුව 12 වන සත වර්ෂයෙන් පසුව -ඇ කාරය -අ බවට පත් වී ඇත. මෙතුමා දක්වනුයේ සිංහලයෙහි දෙවෙනි ගණයෙහි පූර්ව ක්‍රියාවේ ප්‍රාග් අවස්ථාව ලෙස -ය, -ඉය යන්නෙන් යුත් මධ්‍ය ඉන්දීය පූර්ව ක්‍රියා බව දක්වයි. -ඉ අන්ත පූර්ව ක්‍රියා නිසැකවම අලුත් නිෂ්පත්තියක් බව සඳහන් කරයි. එම වරනැඟීම් ක්‍රමය දෙවැනි වරනැඟීම් ක්‍රමයෙන් වෙන් වූ බව හෙතෙම තහවුරු කරයි (ගයිගර්, 2005).

මෙන්ඩිස් ගුණසේකර (2008) Comprehensive Grammar of the Sinhalese Language නම් කෘතියෙහි වාක්‍යයක අන්තිම ක්‍රියාවට පූර්වයෙන් යෙදෙන ක්‍රියා පෙර කිරිය නොහොත් පූර්ව ක්‍රියාව ලෙස දක්වා තිබේ. එහිලා පූර්ව ක්‍රියාව සකස් කර ගැනීම සඳහා භාවිත කරන ප්‍රත්‍ය පහක් දක්වා ඇත. එනම්,

-අ, -ආ, -ඇ, -ඊ, -ඉන් යනුවෙනි.

එතුමා දක්වන පරිදි -ඇ යන්න පැරණි සිංහලයට සීමා වී ඇති අතර -ඉන් යන්න අලුත් වුවද සිංහලයේ සීමිත වචන ප්‍රමාණයක යෙදෙන බව සඳහන් ය. එසේම අර්ථය තීව්‍ර කිරීම සඳහා ඇතැම් පූර්ව ක්‍රියා සමඟ -ලා යන්න යෙදෙන බව දක්වනු ලැබේ. මෙතුමා පූර්ව ක්‍රියා පද සිංහලයෙහි සෑදෙන ආකාර කිහිපයක් දක්වයි. මෙහි දී පොදුවේ සිදු වනුයේ සාමාන්‍යයෙන් වර්තමාන ක්‍රියා මූලය ආකාර කිහිපයකට වෙනස් කර ගැනීමක් සිදු වන බව දක්වයි. ඉන් පළමු අවස්ථාව නම් ක්‍රියා මූලයේ පළමු වර්ණයේ ඇති අකාරය "ඇ" බවටත් එහි පදාන්තව සිටි "ඉ" කාරය "අ" බවටත් පත් වීමයි.

උදා - අදි = ඇද / පනි = පැන

දෙවනි ක්‍රමය වනුයේ ක්‍රියා මූලයේ පදාන්ත අ-කාරය ආ බවට පත් වීමයි.

උදා- ක = කා / කප = කපා

තෙවැනි ක්‍රමවේදය ලෙස ක්‍රියා මූලයේ "අ" ස්වරය හැර වෙනත් ස්වරයක් යෙදී එම පදය "ඉ" අන්ත වන විට එම ඉ-කාරය අ-කාරය බවට පත් වීමයි.

උදා- ඇවිදි = ඇවිද / සිටි = සිට

එ-කාරාන්ත ක්‍රියා මූලවල අන්තයේ ඇති "එ" ස්වරය "ඊ" බවට පත් වීම සිව්වැනි ක්‍රමයයි.

උදා- ගිලෙ = ගිලී / සැතපෙ = සැතපී

ඉහත රීති කිසිවකටත් අයත් නොවන ව්‍යඤ්ජනවලින් අවසන් වන අක්‍රමවත් පද ද සිංහල පූර්ව ක්‍රියා වශයෙන් යෙදෙන බව දක්වයි.

උදා- ගොස්/අවුත්/ඇවිත්

සෙනරත් පරණවිතාන පෙන්වා දෙනුයේ සිංහල භාෂාවේ අක්‍රමික යැයි කිව හැකි රූප හැර සම්මත භාෂා ව්‍යවහාරයෙහි එන පූර්ව ක්‍රියා රූපවලින් ඉතා වැඩි කොටසක් පන්ති තුනකට බෙදා දැක්විය හැකි බවයි. ඒ අනුව එතුමා පූර්ව ක්‍රියාව ආ-කාරාන්ත, ඇ-කාරාන්ත හා ඊ-කාරාන්ත වශයෙන් ආකාර තුනක් යටතේ දක්වා තිබේ (ගම්ලත්, 2000).

බුත්සරණෙහි ක්‍රියාපද පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහයක් සිදු කරන වී. ඒ. වීරවර්ධන ක්‍රියාපද පිළිබඳ ඉතා ගැඹුරු අධ්‍යයනයක නිරත වී ඇති අතර බුත්සරණෙහි යෙදුණු පූර්ව ක්‍රියා ප්‍රත්‍ය තුනක් දක්වා ඇත. එනම්, -ආ, -ඇ, -ඊ, $\phi$ යන ප්‍රත්‍යයයි. තවද එහි ධාතු ගණ අනුව පූර්ව ක්‍රියා සාධන ක්‍රම කිහිපයක් ඔස්සේ දක්වා ඇත. මීට අමතරව පූර්ව ක්‍රියා සඳහා විශේෂිත පද යෙදීම දක්වමින් මෙම යුගයේ -ගෙනැ, -කොටැ, -පියා, -ලා, -වදාරා වැනි උපකාරක පද යොගයෙන් පූර්ව ක්‍රියා රූප සෑදෙන ආකාරය දක්වා ඇත (වීරවර්ධන, 2012).

අමාවතුරෙහි ක්‍රියාපද පිළිබඳ පදිම විග්‍රහයක් සිදු කරන පූජ්‍ය. විල්පත ධම්මසේන හිමි -ආ, -ඇ, -ඊ යනුවෙන් අමාවතුරෙහි පූර්ව ක්‍රියා සාධනය සඳහා යෙදුණු ප්‍රත්‍ය තුනක් දක්වා ඇත. එසේම විශේෂ පූර්ව ක්‍රියා යටතේ ධාතුගණ කිහිපයක ක්‍රියා රූප දක්වා තිබේ. (ධම්මසේන හිමි, 1982)

මේ ආකාරයෙන් සිංහල භාෂාවේ ක්‍රියාපද හා පූර්ව ක්‍රියා සම්බන්ධයෙන් බොහෝ විද්වතුන් විසින් තොරතුරු දක්වා ඇති ආකාරය ගවේෂණය කළ හැකිය. සීගිරි ගී තුළින් හෙළිවන පැරණි සිංහල භාෂාවේ පූර්ව ක්‍රියාපද සම්බන්ධයෙන් ඇති පර්යේෂණ අන්තරය පූර්ණ කිරීම් වස් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ.
ඒ අනුව, ක්‍රි.ව 8, 9, 10 යනාදි සියවස්වල රචිත සීගිරි ගීවල ඇති පූර්ව ක්‍රියාවේ සංස්ථිතියෙහි ස්වරූපය කෙබඳු ද යන්න අධ්‍යයන කිරීම මෙම පර්යේෂණයෙහි ගැටලුවයි. වාග්විද්‍යාවේ පැනෙන පද විචාරාත්මක සිද්ධාන්ත උපයෝගී කරගනිමින් එම සියවස්වල දී සිංහල භාෂාවේ පූර්ව ක්‍රියාවේ සංස්ථිතිය අධ්‍යයනය කර බැලීමත්, වර්තමාන සිංහල භාෂාවේ එහි ස්වරූපයෙන් කෙතෙක් දුරට වෙනස්කම් හඳුනාගත හැකි ද යන්න අධ්‍යයනය කිරීමත් මෙම පර්යේෂණයේ අරමුණයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ද්විතීයික මූලාශ්‍රය ආශ්‍රයෙන් සිදු කරනු ලබන පර්යේෂණයකි. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් රචිත සීගිරි ග්‍රැෆිටි කෘති මෙහිලා ද්විතීයික මූලාශ්‍රය වශයෙන් යොදාගන්නා ලදි. න්‍යායාත්මක දැනුම උදෙසා වාග්විද්‍යාත්මක කෘති සිංහල භාෂාව හා ව්‍යාකරණය සම්බන්ධ ග්‍රන්ථ පරිශීලනය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි.

මෙහි දී සීගිරි පද්‍යවල සඳහන් ක්‍රියාපද ආශ්‍රයෙන් දත්ත ලැයිස්තුවක් සකසා ගත් අතර එය සීගිරි ගීවල පද්‍ය අංකය, අදාළ සියවස, පද්‍ය අන්වය, අදාළ ක්‍රියා පදය, IPA ප්‍රතිලේඛනය, පදිම වර්ගීකරණය හා අදාළ ව්‍යාකරණ ප්‍රවර්ගය යනුවෙන් එක්සෙල් යෙදවුමක භාවිතයෙන් වර්ගීකරණය කර ගන්නා ලදි. එම දත්ත ලැයිස්තුවෙන් පූර්ව ක්‍රියාපද වෙන්කර ගැනීමත් ඒවා පදිම විචාරයෙහි පැනෙන සිද්ධාන්ත අනුසාරයෙන් විශ්ලේෂණයත් සිදු කරන ලදි. එහි දී පදක, පදිම හා පදාණු හඳුනාගැනීමත්, සර්ගක පදිම හඳුනාගැනීමත්, ඒවායෙහි සංස්ථිතික ලක්ෂණ හඳුනාගැනීමත් සිදු කරන ලදි.

පූර්ව ක්‍රියා පද සම්බන්ධ ව්‍යාකරණාත්මක විශේෂතා හා සංස්ථිතික ලක්ෂණ පිළිබඳ සැලකීමේ දී පහත කරුණු අනුගමනය කිරීම ද මෙම අධ්‍යයනයේ දී සිදු විය. එහි දී පූර්ව ක්‍රියාවේ අන්තය අනුව වර්ගීකරණය කිරීමත් ඒවායෙහි ධාතු ප්‍රකෘති වෙන්කර ගැනීමත් සිදු කරන ලදි. තවද අපර සර්ග යෙදීමෙන් ක්‍රමිකව සෑදෙන පූර්ව ක්‍රියා හා වෙනත් විශේෂ පූර්ව ක්‍රියා යනුවෙන් ප්‍රධාන අංශ දෙකක් යටතේ මෙම නිරීක්ෂණය කරන ලදි. විශේෂ පූර්ව ක්‍රියා යටතේ අක්‍රමික ක්‍රියා මූල සහිත පූර්ව ක්‍රියා උපපද සහිත පූර්ව ක්‍රියා සමාසීකරණයට ලක්ව සෑදුණු පූර්ව ක්‍රියා එකම ධාතුවෙන් විවිධ විකල්පන සහිත පූර්ව ක්‍රියා යනුවෙන් උක්ත දත්ත ගොනුව තවදුරටත් වර්ගීකරණය කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

**ප්‍රතිඵල**

මෙම අධ්‍යයනයට අවැසි දත්ත විශ්ලේෂණයෙන් අනතුරුව පහත ආකාරයෙන් බෙදා දැක්විය හැකිය. එහි දී පූර්ව ක්‍රියාපදවල අන්තය පිළිබඳ සැලකිල්ලට ගනිමින් හා එම පූර්ව ක්‍රියා සඳහා භාවිත ක්‍රියා මූල සැලකිල්ලට ගනිමින් මෙම විශ්ලේෂණය සිදුකෙරිණි.

ඉ - අන්ත පූර්ව ක්‍රියා

| පූර්ව ක්‍රියාව | ධාතු ප්‍රකෘතිය | ප්‍රත්‍ය යෙදීම | පද්‍ය අංක |
|---|---|---|---|
| සැජි | සද | සද + ඉ = සැජ් + ඉ | 3 |
| නැගි | නග | නග + ඉ | 20 |
| දි | දෙ | දෙ + ඉ | 42 |
| බැසි | බසි | බසි (බැසි) | 47 |
| වි | වෙ | වෙ + ඉ | 108 |

ඊ - අන්ත පූර්ව ක්‍රියා පද

| පූර්ව ක්‍රියාව | ධාතු ප්‍රකෘතිය | ප්‍රත්‍ය යෙදීම | පද්‍ය අංක |
|---|---|---|---|
| වී | වෙ | වෙ + ඊ | 22 |
| කී | කිය | කිය + ඊ | 27 |
| නැඟී | නග | නග + ඊ | 36/37/48/72 |
| දී | දෙ | දෙ + ඊ | 42 |
| හැලී | අල | අල + ඊ | 159 |
| බැලී | බල | බල + ඊ | 167 |
| ඉගිලී | ඉගිල | ඉගිල + ඊ | 178 |

අ - අන්ත පූර්ව ක්‍රියා පද

| පූර්ව ක්‍රියාව | ධාතු ප්‍රකෘතිය | ප්‍රත්‍ය යෙදීම | පද්‍ය අංක |
|---|---|---|---|
| අද | එ/අද | - φ | 7/91 |

| | | | |
|---|---|---|---|
| නිව | නිව | - ф | 32 |
| නැග | නග | - ф | 44 |
| ජහ | ජහ | - ф | 71 |
| අව | අව/එ | - ф | 107 |
| අ | එ/අ/අව | - ф | |

ආ - අන්ත පූර්ව ක්‍රියා පද

| **පූර්ව ක්‍රියාව** | **ධාතු ප්‍රකෘතිය** | **ප්‍රත්‍ය යෙදීම** | **පද්‍ය අංක** |
|---|---|---|---|
| බලා | බල | -ආ | 46 |
| බමා | බම | -ආ | 121 |
| අසා | අස | -ආ | 156 |
| පොලොබා | පොලොබ | -ආ | 194 |

ඇ - අන්ත පූර්ව ක්‍රියා පද

| පූර්ව ක්‍රියාව | ධාතු ප්‍රකෘතිය | ප්‍රත්‍ය යෙදීම | පද්‍ය අංක |
|---|---|---|---|
| බැණැ | බණ | -ඇ | 14/60 |
| වියොවැ | වියොව් | -ඇ | 68 |
| සෙවැ | සෙව | -ඇ | 81 |
| ඇනැ | අන | -ඇ | 84 |
| ජැහැ | ජහ | -ඇ | 85 |
| දැටැ | දැට් | -ඇ | 120 |
| ඇලවැ | ඇල | -ව් + ඇ | 142 |
| ඇවිදැ | ඇවිජ | -ඇ | 149 |
| දැකැ | දක් | -ඇ | 153 |
| වැසැ | වාස | -ඇ | 165 |
| අදන්වැ | අදන් | -ව් + ඇ | 198 |

හල් අන්ත පූර්ව ක්‍රියා පද

| පූර්ව ක්‍රියාව | ධාතු ප්‍රකෘතිය | පද්‍ය අංක |
|---|---|---|
| ඇවැජ් | එ | 1 |
| අන්ද්වය් | අද | 2 |
| අවුජ් | එ | 4/15/56/124 |
| අයුත් | එ | 172 |
| ඇවිද් | එ | 167 |
| ඇවිජ් | එ | 26 |
| අවුද් | එ | 43 |
| බලය් | බල | 48/59/195 |
| දිව් | දුව | 73 |
| නගය් | නග | 113 |
| තබය් | තබ | 130/186 |
| තොරය් | තොර | 13 |

විශේෂ පූර්ව ක්‍රියා රූප

| පූර්ව ක්‍රියාව | ධාතු ප්‍රකෘතිය | පද්‍ය අංක |
|---|---|---|
| වී | ව | 22 |
| කී | කිය | 27 |
| දි | දෙ | 42 |
| දී | දෙ | 42 |
| යෙ | ය | 54 |
| අ | අ | 59/120 |
| බලයි | බල | 189 |
| තබයි | තබ | 57 |
| අසය | අස | 133 |
| සිටුවයි | සිට | 136 |
| නමය | නම | 166 |
| බලය | බල | 182 |

උප පද යෙදුණු පූර්ව ක්‍රියා රූප

| පූර්ව ක්‍රියාව | පද්‍ය අංක |
|---|---|
| නැග-ල | 15 |
| ගලෙ-ල | 159 |
| ගෙලෙ-ල | 178 |
| ඔසැරියේ-ලය් | 113 |
| සිහිකොට් | 72 |
| කුමක් කොට් | 123 |
| අදහගත | 136 |

සමාසීකරණයට ලක්ව සෑදුණු පූර්ව ක්‍රියා රූප

| පූර්ව ක්‍රියාව | පද්‍ය අංක |
|---|---|
| ගිම්නිව | 178 |
| සොව්පත් | 18 |
| සුරතත් නගය් | 113 |
| යොමුවැ-ඔත් | 90 |
| හය ගොසින | 79 |

එකම ධාතුවට අයත් විවිධ රූප සහිත පූර්ව ක්‍රියා රූප

- ඇවැජ්/අවුජ්/අද/අවුද්/අවුජිනි/අව/අ/අවුදු/ඇවිද්/අයුත/ඇවිත්
- ගොස්/ගොසින්/ගොස්නි/ගොසිනි/ගොසින
- නැගි/නැගී/නැග/නෙගි
- බලයි/බලය/බලය්/බලා

ධාතු ප්‍රකෘතියට අනුව වර්ග කිරීම

| අකාරාන්ත | අකාරාන්ත | එකාරාන්ත | ඉකාරාන්ත | හලන්ත |
|---|---|---|---|---|
| සද, නග | යා | දෙ | බස්/බැසි | වියොව් |
| බල, කිය | | වෙ | | දැට් |
| අල, ඉගිල | | එ | | දක් |
| අද, නිව | | | | අදන් |
| නග, බම | | | | |
| අස, බණ | | | | |
| සෙව, අන | | | | |
| ජහ, ඇල | | | | |

**සාකච්ඡාව**

ඉහත දත්තවලට අනුව පැහැදිලි වනුයේ සීගිරි ගීවල ඉතා සුලබව පූර්ව ක්‍රියා පද යෙදී ඇති බවයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී එම පූර්ව ක්‍රියා අංශ කිහිපයක් යටතේ විශ්ලේෂණය කරගන්නා ලදි. එනම්,

- ප්‍රත්‍ය යෝගයෙන් සෑදෙන පූර්ව ක්‍රියා
- උපපද යෝගයෙන් සෑදෙන පූර්ව ක්‍රියා
- එකම ධාතුවෙන් සෑදුණු විවිධ ස්වරූප සහිත පූර්ව ක්‍රියා
- සමාසීකරණයට ලක් වූ පූර්ව ක්‍රියා
- ප්‍රයෝජ්‍ය පූර්ව ක්‍රියා පද
- ධාතු ප්‍රකෘති අනුව වර්ගීකරණය

විශේෂයෙන් පූර්ව ක්‍රියාව යනු අවසාන ක්‍රියාවට පෙර සිදුවන ක්‍රියාව බව මතු ද සඳහන් කරන ලදි. කාලය සම්බන්ධයෙන් සැලකූ විට පූර්ව ක්‍රියාව යන්න අතීත කාලික නිපාත ක්‍රියා වේ. සාමාන්‍යයෙන් අතීත ශබ්ද සෑදීමේ දී පොදු ක්‍රමයක් ලෙස ක්‍රියා ධාතුවෙහි ස්වර පූර්වීකරණයට ලක්වීම දැක්විය හැකිය. සීගිරි පද්‍යවල එන ඇතැම් පූර්ව ක්‍රියාවල දී මෙම ලක්ෂණය හඳුනාගත හැකිය.

උදා - √සද - සැජී
√නග - නැගි
√බසි - බැසි

සීගිරි පද්‍යවල සඳහන් පූර්ව ක්‍රියා විශ්ලේෂණය කිරීමේදී ඉහත සඳහන් ආකාරයට අංශ කිහිපයක් යටතේ වර්ග කර දැක්විය හැකිය. ඒ අනුව සීගිරි පද්‍යවල ක්‍රමිකව පූර්ව ක්‍රියා සාධනය සඳහා යෙදුණු අපර සර්ග කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

-ඉ -ඊ -ф -ආ -ඇ

මෙහි සඳහන් පළමු සර්ග දෙක අකාරාන්ත හා එකාරාන්ත ක්‍රියා ධාතු සමඟ -ඉ සහ -ඊ යන අපර සර්ග යෙදී පූර්ව ක්‍රියා පද සාධනය වී ඇත.

උදා - නග + ඉ = නැගි / නග + ඊ = නැගී / බල + ඊ = බැලී

දෙ + ඉ = දි / දෙ + ඊ = දී / අල + ඊ = ඇලී/හැලී

වෙ + ඉ = වි / වෙ + ඊ = වී

මෙම ක්‍රියා මූලයන්ට උක්ත සර්ග එක්වීමේ දී ක්‍රියා මූලයේ වෙනස්කම් කිහිපයක් සිදුව තිබේ. එනම්, අකාරාන්ත ක්‍රියා ධාතුවේ පළමු වර්ණයේ ඇති "අ" ස්වරය "ඇ" බවටත්, එකාරාන්ත ඒකවර්ණක ක්‍රියා ධාතුවල පළමු වර්ණයේ ඇති "එ" ස්වරය ලොප් වීමක් සිදුව තිබේ.

මෙහි √බසි යන ධාතු ප්‍රකෘතියම පූර්ව ක්‍රියාවක් ලෙස යෙදී ඇත. දෙවෙනි වර්ණයේ ඇති "ඉ" ස්වරයෙහි බලපෑම මත පළමු වර්ණයේ ඇති "අ" ස්වරය "ඇ" බවට පමණක් පත්ව තිබේ. √කිය ධාතු ප්‍රකෘතියෙහි පූර්ව ක්‍රියාව සාධනයේ දී දෙවැනි වර්ණය ස්වරයත් සමගම ලොප් වී පළමු වර්ණයේ ඇති කෙටි ස්වරය දීර්ඝයක් බවට පත්ව තිබේ. විශේෂයෙන් මේ අවස්ථා දෙකේ දී ම ඇතැම් වර්තමාන ක්‍රියා ප්‍රකෘති අතීත කාලයට සකස් වීමේ දී ස්වර පූර්වීකරණය වීම සිදුව ඇත. එසේ නොවූ අවස්ථා ද සීගිරි පද්‍ය තුළ හමු වේ. නිදසුනක් වශයෙන් √ඉගිල යන්නෙහි පූර්ව ක්‍රියා රූපය වන "ඉගිලී" යන්නෙන් එය පැහැදිලි වේ. √අල යන ප්‍රකෘතියෙහි ඇති පදාදි "අ" ස්වරය "හ" බවට පත්ව ඇත. ඒ අනුව සාධිත ක්‍රියා ප්‍රකෘතිය වනුයේ √හල යන්නයි. එය √හල + ඊ = හැලී යනුවෙන් සැකසී ඇත.

සීගිරි පද්‍ය තුළ ශූන්‍ය ප්‍රත්‍ය යෙදුණු අවස්ථා බහුලව හඳුනාගත හැකිය. එනම් වර්තමාන කාල ධාතු ප්‍රකෘතිය පමණක්ම පූර්ව ක්‍රියාව ලෙස යෙදී ඇත. සාමාන්‍යයෙන් නූතන ව්‍යවහාරයෙහි මෙම ධාතු ප්‍රකෘති සමඟ "ල" යනු උපපදය යොදා ගනිමින් පූර්ව ක්‍රියාපද සකස් කර ගනී.

උදා - නිව + ලා = නිවලා/ කර + ලා = කරලා/ බල + ලා = බලලා

නමුත් මෙම අවධිවල දී ධාතු ප්‍රකෘතිය පමණක් පූර්ව ක්‍රියා ලෙස භාවිත කොට ඇත. තවද, √එ ධාතුවෙන් නිපන් √අද, √අ, √අව වැනි විකල්පන රූප කිහිපයක් මෙම යුගයේ දී පූර්ව ක්‍රියා ලෙස යෙදී තිබේ. වර්තමාන ව්‍යවහාරයෙහි මේවා " පැමිණ", "ඇවිත්", "ඇවිල්ලා", "පැමිණිලා" යනුවෙන් ලේඛන හා භාෂණ වශයෙන් ද්විරූපතා ලක්ෂණයෙන් යුක්තව භාවිත වේ. ඉහත පැරණි රූප භාවිතයෙන් ඉවත්ව තිබේ.

විශේෂයෙන් නූතන ව්‍යවහාරයෙහි පූර්ව ක්‍රියා සාධනයේ බහුලව යෙදෙන තවත් ලක්ෂණයක් වනුයේ අකාරාන්ත වර්තමාන කාල ක්‍රියා ධාතුවලට -ආ යන අපර සර්ගය යොදා පූර්ව ක්‍රියා පද සකස් කර ගැනීමයි. මෙම ලක්ෂණය සීගිරි පද්‍ය තුළද බහුලව හඳුනාගත හැකිය.

උදා - බලා/ බමා/ අසා/ පොලොබා

මධ්‍ය සිංහල යුගය එනම් ක්‍රි.ව. 8 වැනි සියවසින් ආරම්භ වී ඇති අතර මේ අවධියේ දී සිංහල භාෂාවේ විශේෂ පරිණාමීය ලක්ෂණ රැසක් සිදු වූ යුගයකි. එහි දී සිදු වූ විශේෂ ලක්ෂණයක් වශයෙන් "ඇ" ශබ්දය ලේඛනයෙහි නියෝජනය කිරීම සඳහා විශේෂ සලකුණක් පළමු වරට යොදා ගැනීම දැක්විය හැකිය. එම ලක්ෂණය සීගිරි පද්‍ය තුළ බහුලව දැකිය හැකි ලක්ෂණයකි. ඒ අනුව පූර්ව ක්‍රියාපද සකසා ගැනීමෙහිලා විශේෂ අපර සර්ගයක් ලෙස මේ අවධියේ භාවිතයට පැමිණ තිබේ. සීගිරි පද්‍ය තුළ "ඇ" සර්ගයෙන් සැදුණු පූර්ව ක්‍රියාපද බහුලව හඳුනාගත හැකිය. ඉහත දත්ත විශ්ලේෂණයෙහි ඇති දත්ත මගින් ඒ බව පැහැදිලි වේ. අකාරාන්ත හා ඇතැම් හලන්ත ධාතු ප්‍රකෘති සමඟ මෙම "ඇ" සර්ගය යෙදී ඇත.

උදා - බැසැ, බැණැ, වියොවැ, සෙවැ, ජැහැ

මෙම අවධියේ දී සිංහල භාෂාවේ අක්‍රමික ධාතු ප්‍රකෘති කිහිපයක් ද හඳුනාගත හැකිය.

√ව, √දෙ, √ය, √එ, √කිය

මෙම ක්‍රියා මූල මගින් සැදුණු විකල්පන රූප රැසක්ම හමුවන අතර ඒවා එකම ප්‍රකෘති පදිමයකින් සැදුණු පදාණු ගණයෙහිලා සැලකිය හැකිය.




නූතන ව්‍යවහාරයෙහි අ, අද, අව, අවුජ්, ඇවිජ් ආදි පූර්ව ක්‍රියා පූර්ව ක්‍රියා භාවිත නොවේ. වි, වී, වෙලා, ගොස්, ගොසින් වැනි පද නූතන සිංහලයෙහි තවමත් භාවිතයේ පවතී.

සාමාන්‍ය සිංහලයේ හමු නොවන එසේම සමකාලීන සාහිත්‍යයේ ද හමු නොවන විශේෂ පූර්ව ක්‍රියා රූප කිහිපයක් සීගිරි පද්‍ය තුළ අන්තර්ගත වේ.

උදා - බලයි, තබයි, අසය, බලය

වර්තමාන සිංහල භාෂාවේ බලයි, තබයි වැනි ක්‍රියා පද ත්‍රෛකාලික ක්‍රියා යටතේ වර්තමාන කාල ප්‍රථම පුරුෂ ඒකවචන ශුද්ධ ක්‍රියාපද වශයෙන් භාවිත වේ. අසය, බලය යන්න විධික්‍රියා අර්ථයේ භාවිත වේ. එහෙත් සීගිරි පද්‍යවල මෙවැනි බොහෝ ක්‍රියා පද පූර්ව ක්‍රියා ලෙස භාවිත වී තිබේ. මෙහි දී සාමාන්‍ය ආකාරයෙන් සැලකූ විට ඉහත පදවල නිරුක්තිය පහත අන්දමින් දැක්විය හැකිය.

බල + යි, තබ + යි, අස + ය, බල + ය

මේවා විද්වත් මත දෙකක් ඔස්සේ විමසුමට ලක්කළ හැකිය. ඉන් පළමු වැනි අදහස නම්, ගයිගර් ව්‍යාකරණයේ දක්වා ඇති මතයයි. එනම්, සිංහල භාෂාවේ -අයි හා -අය් අන්ත පූර්ව ක්‍රියා තිබූ බවයි. එහිලා -අයි යන්න -අය් අන්ත පදයන්ගේම වෙනස් ස්වරූපයකි. ඒ අනුව "බලය" වැනි පදවල ඇති -අය යන්න -අයි යන්නෙහි වෙනස් ස්වරූපයක් වශයෙන් දැක්විය හැකිය. මෙහි දෙවැනි අදහස නම් පරණවිතාන මතයයි. මොහු පෙන්වා දෙනුයේ මෙය සිංහල භාෂා පරිණාමයෙහි එන ශබ්ද විද්‍යාත්මක ලක්ෂණයක් ප්‍රකට කරන බවයි. එනම්, සිංහල භාෂාවේ "ය්", "ව්", "හ්" ශබ්ද ස්වර මධ්‍යගත අවස්ථාවේ ලෝපයට පත්ව ඇති බවත්, එහි දී එම ශබ්දවල අග ඇති ස්වරය පමණක් ලොප් වී ඇති බවත්, ඒවාට නිදසුන් වශයෙන් බලය්, කරය් වැනි පද දැක්විය හැකි බවත්ය.

ඉහත මත දෙකටම අනුව ඉහත පදවල නිරුක්තිය පහත ආකාරයෙන් දැක්විය හැකිය.

බල + අයි, බල + අය, බල + අය් / බලයි-බලය-බලය්
තබ + අයි, තබ + අය, තබ + අය් / තබයි-තබය-තබය්

ඉහත මත දෙක පිළිබඳ විමසීමේ දී පරණවිතාන අදහස හා යම්තාක් දුරට එකඟ වීම යුක්ති යුක්තය. සමාන ස්වරයන් අතර පිහිටි ය්, ව්, හ් යන අක්ෂර ඉතිරි වන ස්වරයන් දෙදෙනා සන්ධි කරවමින් බොහෝ විට ලොප් වී යාම සිංහල භාෂා පරිණාමයෙහි ලක්ෂණයකි (ගම්ලත්, 2000).

උදා - පය - පා/ ගියි - ගී/ වුයු - වූ

පද මධ්‍යගත උක්ත ශබ්ද ලොප් වීමේ ලක්ෂණය ඇතිවන තෙක්ම මෙම පද පය, ගියි, වුයු යනාදි වශයෙන් පවතින්නට ඇති බව සැලකිය හැකිය. එසේම ඉහත සඳහන් පරිණාමීය ලක්ෂණය ඇති වීමෙන් පසු ඒවා පා, ගී, වූ ලෙස භාවිත වන්නට ඇත. මේ අනුව පැහැදිලි වනුයේ මතු දැක්වූ අන්ද්වය්, බලය්, තබය්, අද්වය් යන පදවල ස්වර මධ්‍යගත -ය්- කාරය ලොප් වීම වෙනුවට ඒවායෙහි පදාන්ත ස්වරය පමණක් ලොප් වී තිබේ. බලය්, තබය්, අද්වය් ආදි පූර්ව ක්‍රියා පද සීගිරි පද්‍ය තුළ බහුල වශයෙන් හමුවනුයේ එබැවිනි. ඒ අනුව එම පද අග ඇති -ය්- කාරය ප්‍රත්‍යයක් නොවන බවත් ශබ්ද පරිණාමයේ දී ඉතිරි වූ ලක්ෂණයක් බවත් පැහැදිලිය. පසුකාලීන යුගවල දී එම පදාන්ත -ය්- කාරය ලොප් වීමේ යුගයෙන් පසුව උක්ත පද බලා, කර, කැරැ, අන්ද්වා, ආදි වශයෙන් සකස් වී ඇත.

නිදසුනක් වශයෙන් පහත පදවල පරිණාමය දැක්වීමෙන් ඒ බව තවදුරටත් මනාව පැහැදිලි වේ.

උදා - මර්ද්‍ය - මඩිය - මෙඩිය - මෙඩය - මඩය් - මැඩ - මැඩැ
ස්ථාප්‍ය - තපය - තබය - තබයි - තබය් - තබා

ඉහත ප්‍රතිඵලවල දක්වා ඇති සීගිරි පද්‍යවලින් උපුටා ගන්නා ලද ඇතැම් පූර්ව ක්‍රියාපද තුළ මෙම පරිණාමීය ලක්ෂණ ශේෂ වී පවතින ආකාරය හඳුනාගත හැකිය. පූර්වෝක්ත සිංහල භාෂා පරිණාමීය ලක්ෂණය ක්‍රි.ව. 8, 9 ආදි සියවස්වල ලියැ වුණු පද්‍යවල තැනින් තැන හමුවේ.

උදා - අන්ද්වය්, බලය්, තබයි, නැගි, අජවය, දැකැ, තබා, බලා

ඉහත ක්‍රියාපද මගින් සිංහල භාෂා පරිණාමයේ කාලවකවානු කිහිපයක් නියෝජනය වන බව මනාව පැහැදිලි වේ. නිදසුනක් වශයෙන් සීගිරි පද්‍ය අංක 48, 73, 75 යන පද්‍යවල එන බලය්, තබය්, අද්වය් යන පූර්ව ක්‍රියාපද ගත් කල්හි උක්ත භාෂා පරිණාමයෙහි කාලය පිළිබඳ යම් අදහසක් හඳුනාගත හැකිය. එනම් ස්වර මධ්‍යගත -ය්- කාරය ලොප් වීම වෙනුවට එහි අන්ත ස්වරය ලොප් වීමේ අවධියයි. ඉහත පද්‍යවල සියවස් පිළිවෙළින් දක්වන්නේ නම් ක්‍රි.ව. 8 වෙනි සියවස අග භාගය හා ක්‍රි.ව. 9 වෙනි සියවසයි. මේ අනුව යම් අනුමාන තර්කයකට එළඹිය හැකිය. එනම් ක්‍රි.ව. 8 වෙනි සියවස අග භාගය සිට ක්‍රි.ව. 9 වෙනි සියවස දක්වා උක්ත පරිණාමීය ලක්ෂණ භාෂාවේ ඇති වෙමින් පවතින්නට ඇති බවයි. පද්‍ය අංක 46 වෙනි ගීයෙහි "බලා" යනුවෙන් පූර්ව ක්‍රියාවක් හමුවේ. එහි කාලය ක්‍රි.ව. 9 වෙනි සිසවසෙහි අග භාගයයි. ඒ අනුව පැහැදිලි වනුයේ ක්‍රි.ව. 8 වෙනි සියවසයේ අග භාගයේ සිට ක්‍රි.ව. 9 වෙනි සියවසයේ අග භාගය වන විට මෙම ශබ්ද ලක්ෂණය භාෂාවේ වෙනස් වී ගොස් ඇති බවය.

උදා = අජවය - අද්වය - අද්වයි - අද්වය් - අද්වා - අද- ඇද- ඇදැ
තබය - තබයි - තබය් - තබා වශයෙනි.

මෙම යුගයේ පූර්ව ක්‍රියාවල උපපද භාවිතයද හඳුනාගත හැකිය. එහිලා වැඩි වශයෙන් යෙදෙනුයේ ඉහත දක්වන ලද ධාතු සමග -ල යන උපපදය භාවිත වීමයි.

උදා -    නැග-ල, ගලෙ-ල, ගෙලෙ-ල, ඔසැරියේ -ලය්

වර්තමාන සිංහලයෙහි මේවා කරලා, බලලා, නටලා, කියලා, දුවලා ආදි වශයෙන් භාවිත වේ. මෙහි දී √ල ධාතුවට ආ-කාරයක් යෙදී එම ධාතුව "ලා" බවට ලත්ව ඇත. නමුත් සීගිරි පද්‍ය තුළ එම ධාතුවෙහි එන දීර්ඝ ස්වරය හ්‍රස්වයක් බවට පත්ව තිබේ. ඉහත උදාහරණ මගින් ඒ බව පැහැදිලි වේ. ඉහත "ගලෙ-ල" හා "ගෙලෙ-ල" වැනි පදවලින් පැහැදිලි වන තවත් කරුණක් නම් මෙම උපපදය නාම ප්‍රකෘති සමඟ මුසු වී පූර්ව ක්‍රියා අර්ථයෙන් භාවිත වන බවයි.

මීට අමතරව "කොට" හා "ගත" යන උපපද යොදා පූර්ව ක්‍රියා සාදාගෙන තිබේ. සමකාලීන සාහිත්‍ය ලෙස අමාවතුර හා බුත්සරණ වැනි පොත්වල පූර්ව ක්‍රියාව සාධනය සඳහා යොදාගත් "පිය", "වදාරා", "අතුට" වැනි පද සීගිරි පද්‍ය තුළ නොයෙදේ.

සමාසීකරණයට ලක් කොට මෙම අවධියේ දී පූර්ව ක්‍රියා සකසාගෙන තිබේ. එහිලා පහත ආකාරයෙන් සමාස වී ඇත.

ගිම්නිව = නාම ප්‍රකෘතිය + ධාතු ප්‍රකෘතිය
සුරතත් නගයේ = නාම ප්‍රකෘතිය + ධාතු ප්‍රකෘතිය
යොමුවැ ඔත් = ධාතු ප්‍රකෘතිය + ධාතු ප්‍රකෘතිය

සීගිරි පද්‍යවල එන පූර්ව ක්‍රියා පිළිබඳ විමසීමේ දී බහුල වශයෙන් එකම ධාතුවට අයත් විවිධ විකල්පන සහිත පූර්ව ක්‍රියා පද හඳුනාගත හැකිය.

එ – ඇවැජ් / අවුජ් / අද / අවුද් / අවුජිනි / අව / අ / අවුදු / ඇවිද් / අයුත / ඇවිත්

ය – ගොස් / ගොසින් / ගොස්නි / ගොසිනි / ගොසින

නග – නැගි / නැගී / නැග / නෙගි

බල – බලයි / බලය / බලය් / බලා

√එ ධාතුවෙන් නිපන් පැමිණ යන පූර්ව ක්‍රියා අර්ථය දීම සඳහා වැඩිම විකල්පන රූප ප්‍රමාණයක් හමු වේ. මෙම ක්‍රියා ධාතුවලට අදාළව වෙනස් විකල්පන ඇතිවීමෙහිලා බලපෑ හේතුව ලෙස මහාචාර්ය පරණවිතාන මහතා දක්වන අදහස වන්නේ අග ව්‍යඤ්ජනය සමාන රූප ගැනීම නිසා ඇති වූ තත්ත්වයක් බවයි. එතුමා පෙන්වා දෙනුයේ ඇවැජ්, අවුජ්, අවුද් ආදි පද සමූහයම ප්‍රාකෘත පාලි භාෂාවන්හි ආපජ්ජ වශයෙන් පෙනෙන පුරාණ ඉන්දීය ආපද්‍ය ශබ්දයෙන් නිපන් බවයි. මෙහි පැරණි සිංහල රූප ලෙස දක්වා ඇත්තේ අපජ හා අවජ යන පදයි. අයුත, අයුත් වැනි රූප පැරණි ඉන්දීය ආගත්‍ය යන්නට සම්බන්ධ වන බව දක්වා ඇත (ගමලත්, 2000).

ඉහත තොරතුරු පිළිබඳ සැලකිලිමත් වෙමින් මේ විකල්පන සම්බන්ධයෙන් වාග්විද්‍යාත්මකව විමසා බැලීම උචිත වේ.

එ – අයි/අ / අව/අවු / අවජ / අවද

ඉහත සටහනට අනුව √එ යන්න මෙම පද ගොනුවෙහි ශුද්ධ ක්‍රියා රූපය වශයෙන් දැක්විය හැකිය. එම ධාතුවෙන් නිපන් අතීත ස්වරූප සකසා ගැනීමෙහිලා විකල්පන කිහිපයක්ම සකසාගෙන තිබේ.

එ + ඉ
ආ + ඉ (ආ - ආදේශය)
ආ + ය් + ඉ (ය් - ආගමය)
අ + ය් + ඉ (දීර්ඝ ස්වර හ්‍රස්ව වීම)
අයි (පසුකාලීන සිංහලයේ "ය" වර්ණය ලෝපයෙන් "අ" පමණක් ඉතිරි වී ඇත)
එ + උ
ආ + උ (ආ - ආදේශය)

ආ + ව් + උ (ව් - ආගමය)
අ + ව් + උ (දීර්ඝ ස්වර හ්‍රස්ව වීම)
අවු ("උ" ස්වරය ලොප් වීමෙන් "අව" යන්න සකසාගෙන තිබේ)

මෙහි √අවජ හා √අපජ යන ක්‍රියා ධාතු පිළිබඳ දැක්වීමේ දී පැහැදිලි වනුයේ මධ්‍ය ඉන්දීය "ආපජ්ජ", "ආපද්‍ය" යන රූපයන්ගෙන් සිංහලයට පැමිණ ඇති බවයි. එයට හේතුව නම් පැරණි සිංහලයෙහි තාලුජ ස්පර්ශ ශබ්දිම ශ්‍රේණියක් දක්නට නොලැබීමයි. පසුකාලීනව පාලි හා සංස්කෘත යන මාතෘ භාෂාවන්ගේ ආභාෂයෙන් සිංහලයට භාෂා රූප සෘණීකරණය කිරීමේ බලපෑමෙන් මෙම ශබ්දිම සිංහල ශබ්දිම පද්ධතියට එකතු වී ඇත. එහි ඉතිහාසගත තත්ත්වය පහත ආකාරයෙන් දැක්විය හැකිය. එනම් පහත පරිසරවල දී "ච" - "ස" බවටත්, "ජ" - "ද" බවටත් පත්ව ඇත.

පදාදි (c-)
ස්වර මධ්‍යගත සංයුක්ත (-cc-/ -ñ c-) = c - s බවට පත් වේ.
ස්වර මධ්‍යගත කේවල -c-
අනෙක් සියලු තැන් ඇති j = j - d බවට පත් වේ (කරුණාතිලක, 2006).

මේ අනුව √අවජ ධාතුව √අවද බවට පත් වීමෙන් ක්‍රියා මූල දෙකක් සෑදී තිබේ. පසුව ඇති වූ ඝෝෂ ශබ්ද අඝෝෂීකරණයට ලක් වීමේ ප්‍රතිඵලයක් ලෙස "ද" - "ත" බවට පත් වීමෙන් "අවුත්" වැනි විකල්පන සැකසී තිබේ. පසුව ඇති වූ භාෂා පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස පදාන්ත ස්වරය ලොප් වීමෙන් හා ස්වර පූර්වීකරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස "ඇවැජ්", " අවුජ්", "ඇවිද්", "අවුත්" වැනි රූප සාධනය වී තිබේ. මේ අනුව වාග්විද්‍යාවේ පැනෙන පදිම විචාරාත්මකව සැලකූ විට √එ යන ප්‍රකෘති පදිමයේ පදාණු ගොනුවක් වශයෙන් අනෙක් රූප දැක්විය හැකිය.

√ය ධාතුවෙන් නිපන් විකල්පන රූපයක් ලෙස √ගොස් යන රූපාන්තරයක් හඳුනාගත හැකිය. මෙය සංස්කෘත √ගම් ධාතුවෙන් සිංහලයට බිඳී ඇත. මෙම ගොස් යන ව්‍යුත්පන්න පදිමයෙන් නිපන් විකල්පන කිහිපයක් සීගිරි පද්‍ය තුළ අන්තර්ගත වේ. මේවාද එකම පදිමයක පදාණු වශයෙන් දැක්විය හැකිය.

ගොස් - ගොස් + ɸ (ක්‍රි.ව 8 )
ගොසින් - ගොස් + ඉන් (ක්‍රි.ව 8 අග හෝ 9 මුල)
ගොසින - ගොස් + ඉන (ක්‍රි.ව 8 මුල)
ගොස්නි - ගොස් + නි (ක්‍රි.ව 8 අවසානය)

උදා - ගොසින මෙ ඔයුන හය පිළි විසි වරදෙක වෙද (පද්‍ය 79)
වැසැ ගොස්නි දුර් රටැ වන වූ හිමින් සිටි නියා (පද්‍ය 165)
දැකැ මින්දිබි ගොසින් ආ ම ගොස් නොලද වෙ තා ලද (පද්‍ය 443)

ඒ අනුව එම පදවල විකාශනය පහත පරිදි සටහන් කළ හැකිය.

ගොස්නි > ගොසින > ගොසින් > ගොස්

මෙම පද මගින් එවකට යෙදුණු තවත් පූර්ව ක්‍රියා ප්‍රත්‍ය කිහිපයක් හඳුනාගත හැකිය.

/නි/ /ඉන/ /ඉන්/ /ɸ/

√නග යන ක්‍රියා මූලයෙහි සංස්ථිතිය විමසීමේදී ද පෙනී යනුයේ එහි රූපාන්තර කිහිපයක් යෙදෙන බවයි.

නෙගි/ නෙගී/ නෙඟි
නැග/ නැගැ/ නැගල/ නැගි/ නැගී/ නැඟි/ නැඟී

මෙම පූර්ව ක්‍රියා පදවල දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලෙස අභිශ්‍රැතිය (Umlaut) දැක්විය හැකිය. ඉහත දක්වන ලද පූර්ව ක්‍රියා සිංහල භාෂාවේ විශේෂිත යුග දෙකක් නියෝජනය කෙරෙයි. එනම් පුරාතන සිංහල යුගය හා මධ්‍යතන සිංහල යුගයයි. පුරාතන සිංහල යුගයේ දී (ක්‍රි.ව. 4-8) අභිශ්‍රැති ඇකාරයේ පළමු පියවර සේ සැලකෙන පදයක පළමු වර්ණයේ එන අකාරය එකාරය වීම දැක්විය හැකිය. එ අනුව වර්තමාන සිංහලයේ භාවිත වන "නැග" යන පූර්ව ක්‍රියා පදය එකල "නෙගි" යනුවෙන් භාවිත විය. ක්‍රි.ව. 8 සිට 13 දක්වා සිංහල භාෂාවේ මධ්‍යතන යුගයයි. මෙම යුගයේ දී අභිශ්‍රැතියේ පළමු අවස්ථාවේ තිබූ එ-කාරය ඇ-කාරය බවට පත්ව ඇත.

නෙගි > නැගි බවට පත්ව ඇත.

මෙම සීගිරි පද්‍ය තුළ එම යුග දෙකම නියෝජනය වන පරිදි පූර්ව ක්‍රියා පද යෙදී තිබේ.

නෙගි > නැගි
නෙගී > නැගී
නෙඟි > නැඟි
නෙඟී > නැඟී

මෙම පදවලට අමතරව මෙම පදයෙහි තවත් පූර්ව ක්‍රියා රූප කිහිපයක් සීගිරි පද්‍ය තුළින් හඳුනාගත හැකිය. එනම්, නැග, නැගැ හා නැගල යනුවෙනි. මේ අනුව වර්තමාන සිංහල ලිඛිත ව්‍යවහාරයෙහි මේ සඳහා බහුලව යෙදෙන පූර්ව ක්‍රියා පදය වනුයේ "නැග" යනුයි. මෙම පදවල සංස්ථිතියෙහි ස්වරූපය පහත අයුරින් දැක්විය හැකිය.

නැග + ඉ
නැග + ඊ
නැග + ɸ
නැග + ඇ
නැග + ල

උදා - මෙ ගී සෙල නෙගි හින්දි බන්ද් හිමියා පෙරෙ මෙළෙන් තම (සීගිරි ගී නිර්මාණ 217)
බෙලිමු නෙගී සිත සෙය අපි බල ගත නොහී අපි යමො (සීගිරි ගී නිර්මාණ 661)
ඇවිද් සීගිරි නෙගි නොකළ අන් කිම් කියන්නෙය් (සීගිරි ගී නිර්මාණ 269)
නැග මෙළෙයින් මුන් මෙගල අව සිහිවෙ දැන් සිහිගිරි (සීගිරි ගී නිර්මාණ 155)

මෙම අධ්‍යයනයේ දී සමස්ත ක්‍රියා මූල අන්තය අනුව පහත ආකාරයෙන් වර්ග කළ හැකිය.

අකාරාන්ත
ආකාරාන්ත
එකාරාන්ත
ඉකාරාන්ත
හලන්ත

එහිලා බහුල වශයෙන් සීගිරි පද්‍යවල එන ක්‍රියා මූල අතර අකාරාන්ත ක්‍රියා මූල බහුලව පවතින බව හඳුනාගත හැකිය.

**සමාලෝචනය**

සීගිරි පද්‍යවල අන්තර්ගත පූර්ව ක්‍රියා රූප ක්‍රමිකව ප්‍රත්‍ය යෝගයෙන් සාධිත පූර්ව ක්‍රියා රූප හා වෙනත් විශේෂ පද සාධන ලක්ෂණ සහිත පූර්ව ක්‍රියා රූප යනුවෙන් අංශ දෙකක් යටතේ වර්ග කළ හැකිය. ක්‍රමික පූර්ව ක්‍රියා රූප සාධනයේ දී -ඉ, -ඊ, -ආ, -ඇ, -ɸ යන ප්‍රත්‍ය පහක් හඳුනාගත හැකිය. මෙහි දී ධාතු ප්‍රකෘතිය විවිධ වෙනස් වීම්වලට භාජනය වී ඇත. එහිලා ස්වරපූර්වීකරණය ප්‍රධාන වශයෙන් බල පා තිබේ. මීට අමතරව විශේෂ ලක්ෂණ සහිත පූර්ව ක්‍රියා රූප සාධනයේ දී සමාසීකරණය, උපපද භාවිතය, ශබ්ද විද්‍යාත්මක ලක්ෂණ යනාදි ක්‍රමවේද ඔස්සේ පූර්ව ක්‍රියා රූප සාධනය කොට ඇත. මෙහිලා මාතෘ භාෂාගත ආභාෂයෙහි බලපෑමට ද ලක්ව තිබේ. භාෂා පරිණාමයෙහි වැදගත් අවධියක් නියෝජනය කරන ලේඛන වාර්තාවක් වශයෙන් සීගිරි පද්‍ය ඉහත දී දක්වන අතර එහිලා පූර්ව ක්‍රියා සාධනයේ දී එම පරිණාමීය ලක්ෂණ බලපා ඇති ආකාරය මතු ද සඳහන් කරන ලදි. විශේෂයෙන් සමකාලීන සිංහල සාහිත්‍යයෙහි එන ග්‍රන්ථ හා සීගිරි ගී සැසඳීමේ දී ඇතැම් පූර්ව ක්‍රියා රූප මීටම ආවේණික වන අතර ඇතැම් ඒවා සිංස්ථිතික වශයෙන් සමානතාවක් පෙන්නුම් කරන බව හඳුනාගත හැකිවිය. වර්තමාන සිංහල භාෂාව හා සංසන්දනය කිරීමේ දී ඇතැම් රූප දැනට සිංහල භාෂාවේ භාවිත නොවන බවත්, ඇතැම් රූප ඒ ආකාරයෙන්ම නූතනයේ ද භාවිත වන බවත්, තවත් කොටසක් භාෂා පරිණාමයත් සමඟ සංවර්ධනය වී විකාශනයට පත්ව ඇති ආකාරයත් හඳුනාගත හැකි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

කරුණාතිලක, ඩබ්.එස්. (2014) *සිංහල භාෂා ව්‍යාකරණය*. ඇම්.ඩී ගුණසේන සහ සමාගම.
කරුණාතිලක, ඩබ්ලිව්. එස්. (2006). *ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය*. එස් ගොඩගේ සහ සහෝදරයෝ.
ගම්ලත්, එස්. (2000). *සීගිරි කුරුටු ගී*. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.
ගයිගර්. ඩබ්. (2005). *සිංහල භාෂා ව්‍යාකරණය*. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
දිසානායක, ජේ.බී. (2001). *බසක මහිම 11 - ක්‍රියා පදය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
ධම්මසේන, ඩබ්. (1982). *අමාවතුරේ ක්‍රියාපද පිළිබඳ පදිම විග්‍රහයක්.* (ශාස්ත්‍රවේදී උපාධි නිබන්ධනය). කැලණිය විශ්වවිද්‍යාලය.
පේමානන්ද, පී. (2004). *සිංහල භාෂාවේ පරිණාමය හා සිදත් සඟරාව*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
මුදියන්සේ, එන්. (2004). *සීගිරි පද්‍යාවලිය*. දෙවන මුද්‍රණය. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
මුනිදාස, කේ. (2022). *ක්‍රියා විවරණය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
වීරවර්ධන, වී. ඒ. (2011). *බුත්සරණේ ක්‍රියාපද පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහයක්.* (දර්ශනපති උපාධි නිබන්ධනය). කැලණිය විශ්වවිද්‍යාලය.
සෝමාලෝක, කේ. (2014). *සිදත්සඟරා වියරණ විමසුම*. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
සෝරත, ඩබ්. (1999). *සුමංගල ශබ්දකෝෂය. ප්‍රථම භාගය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
සෝරත, ඩබ්. (1999). *සුමංගල ශබ්දකෝෂය. ද්විතීය භාගය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
Gunasekara, A.M. (2008). *Comprehensive Grammar of the Sinhalese Language*. S. Godage & Brothers (Pvt) Ltd.
Karunatillake, W.S. (2012). *Etymological lexicon of the Sinhala language*. S. Godage & Brothers (Pvt) Ltd.
Paranavitana, Senarat. (1956). *Sigiri Graffiti: Being Sinhalese Verses of the Eighth, Ninth, and Tenth Centuries*. Vol. I. London: Oxford University Press for the Archaeological Survey of Ceylon.
Paranavitana, Senarat. (1956). *Sigiri Graffiti: Being Sinhalese Verses of the Eighth, Ninth, and Tenth Centuries*. Vol. II. London: Oxford University Press for the Archaeological Survey of Ceylon.